

# ජාතියට නැණ නුවණ බෙදන
# මහා පොත්ගුලේ කතාව

**ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්කිරීමට දායක වූ තොරතුරු තාක්ෂණයේ සංවර්ධනාත්මක අවධියක අද අපි ජීවත්වෙමු. එහිදී සංවර්ධනය වෙමින් පවත්නා රටවල මෙන්ම සංවර්ධිත රටවලද පුස්තකාලවලට පැවරී ඇති වගකීම් ඉතා විශාල වේ. ජාතියක නැණ නුවණ පහදු සංවර්ධන කරා රැගෙන යාමට කැපවී සිටින ශ්‍රී ලාංකීය මහා පොත්ගුල රටට ඉටු කරන සේවයයි මේ.**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා පනත යටතේ 1970 දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවනු ලැබිණි. මෙම නව ආයතනයේ මූලික අරමුණ වූයේ කාලාන්තරයක් තිස්සේ පැවති අවශ්‍යතාවක් වූ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීම හා රටට පුස්තකාල සේවා ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමයි. ඒ අනුව 1990 අප්‍රේල් 27 දින ජාතික පුස්තකාලය විවෘත කරන ලදී. ඉන් අනතුරුව 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සතු වගකීම් හා කාර්යභාරය වඩා පුළුල් වූ අතර එහි නිල නාමය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ලෙසත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නම් වූ අංශය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ලෙසත් වෙනස් විය. නිදහස් මාවතේ පිහිටි ජාතික පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණයේ ඇති මෙම ආයතන දෙක වර්තමානයේ පොත්පත් සම්බන්ධයෙන් ඉටුකරන කාර්යභාරය අතිමහත් ය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යටතේ පිහිටුවා ඇති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම පර්යේෂණ පුස්තකාලය ලෙස හැඳින්විය හැකි ය. පර්යේෂකයන්ටත් ශිෂ්‍ය ශිෂ්‍යවන්ටත්, සාමාන්‍ය පාඨකයන්ට සේවාවන් ගණනාවක් ඉටුකරන මෙය ප්‍රධාන අංශ හයකින් යුක්ත වේ.

ප්‍රතිග්‍රහණ අංශය

පාඨක සේවා අංශය

සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය

තොරතුරු තාක්ෂණ අංශය

ග්‍රන්ථ විඥාපන සේවා අංශය

ප්‍රලේඛන සේවා අංශය

ප්‍රතිග්‍රහණ අංශය මගින් සියලුම ජනකොටස්වල භාවිතය සඳහා අවශ්‍ය පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් ලබා ගැනීම කරයි. පොත්, පුවත්පත්, වාරසඟරා, පශ්චාත් උපාධි නිබන්ධන, පුස්කොළ පොත්, සිතියම් ගැසට් ආදී වූ මුද්‍රිත මාධ්‍ය මෙන්ම දෘශ්‍ය මාධ්‍යවන දෘශ්‍ය කැසට්පට, සංයුක්ත තැටි, ආදිය ද ලබාගැනීම මෙහිදී සිදුවේ.

මෙම මධ්‍යස්ථානය සඳහා ත්‍යාග හා පරිත්‍යාග ලෙසත්, දේශීය හා ජාත්‍යන්තර හුවමාරුව මගිනුත් ලැබෙන පොත්පත් ප්‍රමාණය ඉතා විශාල ය. එමෙන්ම නීත්‍යානුකූල තැන්පතුවක් ද මෙහි තිබේ. 1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනතේ 1976 සංශෝධනයෙන් හා 1998 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත මගින් ශ්‍රී ලංකාවේ

පළවන සෑම ප්‍රකාශනයකම පිටපතක් ජාතික පුස්තකාලයේ තැන්පත් විය යුතු බවට ඇති වගන්තිය මෙසේ නීත්‍යනුකූලව පොත් ලැබීමට හේතු විය. ඒ අනුව 1976 න් පසු ප්‍රකාශයට පත් වූ ප්‍රකාශන දළ වශයෙන් 1,65,000ක ප්‍රමාණයක් මෙම පුස්තකාල සේවා මධ්‍යස්ථානයට අයත් වේ.

එසේම ප්‍රමිති අංක, ව්‍යාපෘති, තැන්පතු හා ප්‍රකාශන ආධාර ව්‍යාපෘති තැන්පතුවක් ද මෙහි ඇත. ජාතික පුස්තකාලසේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය,, මාලිත අංක ව්‍යාපෘතිය හා සංගීත අංක ව්‍යාපෘතිය යටතේ ලැබෙන ජාතික ග්‍රන්ථ ප්‍රමාණයක් ඉතා විශාල වේ. නීත්‍යනුකූල තැන්පතු නීතිය ක්‍රියාත්මක වීමේ දී සිදුවන ප්‍රමාදදෝෂයන් පවා මෙම ව්‍යාපෘතිය මගින් වලක්වාගත හැකිවීම නිසා ආයතනය සතුවන ග්‍රන්ථ ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගනී.

පුස්තකාල සේවා මධ්‍යස්ථානයට පොත් මිලදී ගැනීම ද කරයි. නමුත් එහිදී අත්‍යවශ්‍ය හා සුවිශේෂී පොත් මිලදී ගැනීම කරනු ලබයි. ඒ අනුව විදේශ රටවල ශ්‍රී ලංකාව ගැන පළ වූ ප්‍රකාශන, විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රකාශන, වෙනත් පුස්තකාලවලට ලබා ගැනීමට අපහසු පර්යේෂණවලට අවශ්‍ය විමර්ශන මූලාශ්‍ර ආදි වටිනා ප්‍රකාශන මිලදී ගැනීම කරයි. ඒ අනුව මෙම අංශය මගින් පාඨකයන්ට අවශ්‍ය සියලු ප්‍රකාශන පුස්තකාලය තුළ ගබඩා කිරීමට කටයුතු කරන බව පැහැදිලි වේ.

පුස්තකාල සේවා මධ්‍යස්ථානයේ අනෙක් ප්‍රධාන අංශය ලෙස පාඨක සේවා අංශය හැඳින්විය හැකි යි. ජාතික පුස්තකාලයේ තැන්පත්කර ඇති පොත්පත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පරිශීලනය කිරීමට පාඨකයන්ට අවස්ථාව සලසාදීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය යි. මහල් තුනක සංවිධානය වී ඇති ලක්ෂ තුනකට අධික ග්‍රන්ථත්, පුවත්පත් , සඟරා, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඇතුළු විද්‍යුත් මාධ්‍යත් මෙහිදී පාඨක විමර්ශනයට වෙන්කර තිබේ.මෙම අංශයෙන් ඉටුකෙරෙන ප්‍රධාන කාර්යයන් ලෙස මේවා හැඳින්විය හැකිසි.

විමසීම් සේවය
ක්ෂණික තොරතුරු සේවය
විමර්ශන සේවය
අන්තර්ජාල හා බහුමාධ්‍ය සේවය
ඡායාපිටපත් සේවය
අන්තර් පුස්තකාල පිරුළු සේවය
පාඨක අධ්‍යාපන සේවය
පාඨකයන්ට සෘජුවම පොත් කරා ළඟාවීමේ හැකියාවත් නොමැති වුවත් කර්තෘ, ග්‍රන්ථ නාමය, පරිවර්තක, සංස්කාරක, විෂය, වර්ග අංක ආදී වූ ඕනෑම තොරතුරක් මාර්ගයෙන් අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය පහසුවෙන් ඉල්ලුම් කළ හැකි යි.

පුස්තකාලයට අයත් සියලුම මුද්‍රිත මාධ්‍ය මෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය විද්‍යුත් මාධ්‍ය සංරක්ෂණය කිරීම සඳහා 1982 දී සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය යනුවෙන් වෙනම අංශයක් පිහිටුවන ලදී. මෙම අංශයේ කාර්යභාරය ප්‍රධාන වශයෙන් ද්විත්වාකාර වේ.

1. ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම.

2. ජාතික මට්ටමේ සංරක්ෂණ සේවා ඉටු කිරීම.

මෙහි දී පොත් බැඳුම්හල, සංරක්ෂණ ඒකකය සහ ධූමායන ඒකකය මගින් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු සියල්ල සිදු කෙරේ.

මෙම අංශය මගින් දිවයින පුරා විසිරී ඇති පුස්තකාලවල, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීමේ ජාතික මට්ටමේ කටයුතු ද සිදු කරයි.



**පුස්තකාල සේවා මධ්‍යස්ථානයේ අනෙක් ප්‍රධාන අංශය ලෙස පාඨක සේවා අංශය හැඳින්විය හැකි යි. ජාතික පුස්තකාලයේ තැන්පත්කර ඇති පොත්පත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පරිශීලනය කිරීමට පාඨකයන්ට අවස්ථාව සලසාදීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය යි**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ඇති අනෙක් ප්‍රධාන අංශය ලෙස තොරතුරු තාක්ෂණ සේවා අංශය හැඳින්විය හැකි ය.

ජාතික සංවර්ධනය සඳහා පර්යේෂකයන්ට නවතම තොරතුරු කඩිනමින් ලබාදීම අතිශයින් වැදගත් වන නිසා මෙම මධ්‍යස්ථානයේ කටයුතු පරිගණකගත කිරීමත්, අනෙකුත් පුස්තකාලවල කටයුතු පරිගණකගත කිරීම සඳහා සහාය ලබාදීමත් මෙම අංශයට අදළ කාර්යභාරය යි.

ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ග්‍රන්ථ විඥාපන සේවා අංශය මගින් විවිධ විෂයන්ට අදළ නාමාවලි හා අනුක්‍රමණිකා සමපාදනය කරනු ලැබේ.

එහිදී :

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන)

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (පූර්වකාලීන)

ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව

විශේෂ ග්‍රන්ථ නාමාවලි

ජාතික පුස්තකාල සූචිය සම්පාදනය යන කාර්යයත් ඉටුකරනු ලබයි. මෙම අංශය තුළ 1937 සිට 1962 දක්වා වූ කාලය ආවරණය වන පරිදි පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කර ඇති නිසා ප්‍රකාශන කර්මාන්තයේ මුල් අවධිය පිළිබඳව පාඨකයාට මනා අවබෝධයක් ලබා ගැනීම පහසු වේ. එමෙන්ම මෙම අංශයේ ඇති ළමා ග්‍රන්ථ නාමාවලිය ළමා පුස්තකාල සංවර්ධනයට බෙහෙවින් උපකාරී වේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රලේඛන සේවා කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රලේඛන සේවා අංශයෙන් සුවිශේෂී මෙහෙවරක් සිදුවේ. ජාතික පුස්තකාලයේ ඇති තොරතුරු හා රට තුළ විසිරී ඇති විවිධ ක්ෂේත්‍රවල තොරතුරුත් පාඨකයන්ට පහසුවෙන් ලබාගත හැකි ලෙස සකස් කර තිබේ.

තවද මෙම අංශය මගින් පශ්චාත් උපාධි නිබන්ධන නාමාවලිය (1981 - 2000) ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය, ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව යන අංශ මගින් ද තොරතුරු ගවේශණය කිරීමේ හැකියාව තිබේ.

දෙස් විදෙස් තොරතුරු එක් රැස් කර ජනතාවගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ඉටු කෙරෙන අතර ගුණාත්මක බවින් උසස් ග්‍රන්ථ පාඨකයන් අතට ලබාදීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ මණ්ඩලය ස්ථාපිත කරන ලදී.

මෙම ආයතනය ප්‍රධාන අංශ තුනකින් සමන්විත වේ.

පුස්තකාල සංවර්ධන හා පර්යේෂණ අංශය

* අධ්‍යාපන හා පුහුණු අංශය
* ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය

පුස්තකාල සංවර්ධන කටයුතු අංශය මගින් සිදු කෙරෙන ප්‍රධාන සේවාවන් රාශියකි.

* දේශීය පුස්තකාල ව්‍යවස්ථා, නීති රීති හා චක්‍රලේඛ සම්පාදනය හා නවීකරණය කිරීම.
* පුස්තකාල හා වෘත්තීය උපදේශක සේවා.
* ජාතික හා පළාත් මට්ටමින් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
* පුස්තකාල ප්‍රමිති සම්පාදනය.
* පුස්තකාල ක්ෂේත්‍රයේ බඳවා ගැනීම් හා උසස් කිරීම් කටයුතු සඳහා සහායවීම.
* පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම.
* කියවීමේ රුචිය වර්ධනය කිරීමේ ව්‍යාපෘති.
* පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග හා පහසු මිලට පොත් සැපයීම.
* ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් පොත් ප්‍රදර්ශන පැවැත්වීම.
* පුස්තකාල ලිපි ද්‍රව්‍ය හා මෙවලම් සැපයීම යන සියලු කාර්යයන් මෙම අංශය මගින් ඉටු කරයි.

ලංකාව පුරා ඇති විවිධ ආයතනවල පුස්තකාලවලට මෙම ආධාර හා පරිත්‍යාග ලබාදීම මෙන්ම උපදේශක සේවාවන් ලබාදීම කරයි. ඒ අනුව වර්තමානයේ සියලුම පාසල්වල පුස්තකාල පිහිටුවා ඇති අතර ස්වේච්ඡා මට්ටමින් ග්‍රාමීය ප්‍රදේශවල ද පුස්තකාල පිහිටුවා තිබේ. ඒ අනුව මෙම මණ්ඩලය මගින් උපදෙස් හා ආධාර ලබාදෙන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල ප්‍රමාණය මෙසේ දැක්විය හැකි ය.

පාසල් පුස්තකාල 10382
මහජන පුස්තකාල 840
පිරිවෙන් පුස්තකාල 615
විශ්ව විද්‍යාල පුස්තකාල 32
කාර්මික විද්‍යාල පුස්තකාල 27
ජාතික අධ්‍යාපන පීඨ පුස්තකාල 17
ගුරු විද්‍යාල පුස්තකාල 16

ඒ අනුව මෙම අංශය මගින් ලංකාවේ පුස්තකාල සංවර්ධනය හරහා බුද්ධිමත් පාඨක පිරිසක් බිහි කිරීමේ කාර්යය නිසි ලෙස ඉටු කිරීමට උත්සාහ කරන බව පැහැදිලි වේ.

ප්‍රලේඛන මණ්ඩලයට අයත් තවත් ප්‍රධාන අංශයක් ලෙස අධ්‍යාපන හා පුහුණු කටයුතු අංශය හැඳින්විය හැකියි. මෙම අංශය මගින් ඉටු කෙරෙන කාර්යභාරයන් මෙසේ හැඳින්විය හැකියි.

* පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට අදාළ කෙටිකාලීන පුහුණු පාඨමාලා හැඳින්වීම.
* වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
* පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථ දේශීය භාෂාවලට පරිවර්තනය හා ප්‍රකාශනය.
* වෙනත් පුස්තකාල අධ්‍යාපනික ආයතන සමග සබඳතා පැවැත්වීම.

දේශීය ග්‍රන්ථ ප්‍රකාශනයෙහි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා මෙම ආයතන පිහිටුවා ඇති අනෙක් ප්‍රධාන අංශය නම් ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයයි. මේ මගින් ග්‍රන්ථ මෙන්ම ලේඛනයන්, ප්‍රකාශකයන් දිරිගැන්වීම ද කරනු ලබයි. ඒ අනුව මෙම අංශය සතු කටයුතු ලෙස මේවා දැක්විය හැකියි.

* නව ප්‍රකාශන මිලදී ගැනීම.

එහි දී කතුවරුන්ට ඔවුන්ගේ පොත් අලෙවි කර ගැනීමට දිරි දීමක් ලෙස ප්‍රකාශනයන් 25 - 30 අතර පිටපත් ප්‍රමාණයක් මිලදී ගෙන පුස්තකාලයේ තැන්පත් කරයි.

* මුද්‍රණයේ නොමැති නව සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය සඳහා ආධාර ලබාදීම.
* සම්භාව්‍ය කෘති සංස්කරණය / පරිවර්තනය.
* ජාතික පුස්තකාල ප්‍රකාශන මුද්‍රණය කිරීම.
* ප්‍රකාශන සූචිකරණ දත්ත නිකුත් කිරීම.
* ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ අත්පොත් පළ කිරීම.
* අන්තර් ජාතික ප්‍රමිති අංක (ISBN, ISSN, ISMN) නිකුත් කිරීම.

ශ්‍රී ලංකාවේ බිහිවෙන ප්‍රකාශන සඳහා අන්තර්ජාතික වශයෙන් අනන්‍යතාවයක් හා ප්‍රචාරණයක් ලබාදීම මෙම අන්තර් ජාතික ප්‍රමිති අංක ලබාදීමෙන් සිදු කෙරේ.

ඒ අනුව ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ ISO2108 දරන ප්‍රමිති නිර්දේශ අනුව ග්‍රන්ථ සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක(ISBN) ත්, වාර ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක (ISSN) ත්, මුද්‍රිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක (ISMN) ත් ලෙස අංක ලබාදීම සිදුවේ. මෙම අංක ලබාදීම නිසා ජාතික ප්‍රකාශන හා වෙළෙඳ කටයුතු, සූචිකරණය, පොත් ඇනවුම් කිරීම ආදී සියලු කාර්යයන් පහසු වී තිබේ. ඒ අනුව මෙය කර්තෘවරුන්ට, ප්‍රකාශශකයන්ට මෙන්ම පුස්තකාලයාධිපතිවරුන්ටත් අත්‍යවශ්‍ය පොතට වටිනාකමක් ලැබෙන අන්තර්ජාතික පිළිගැනීමක් ලැබෙන කටයුත්තකි. මෙම සියල්ල සිදු කරන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය ය.

රටක අධ්‍යාපන හා සංස්කෘතික සංවර්ධනයේදීත්, සමාජීය සංවර්ධනයේදීත් පුස්තකාලය වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර 1970 දී ශ්‍රී ලංකාවේ පිහිට වූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මෙන්ම 1990 දි ඉදි වූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ සංවර්ධන හා සමස්ත සමාජයීය සංවර්ධනය සඳහා කැපවී සිටින ආයතනයක් බව පැහැදිලි වේ. වර්තමානයේ ජාතියට නැණ නුවණ බෙදන මෙම මහා පොත්ගුල රටට බුද්ධිමතුන් බිහිකරන තෝතැන්න ය.

❑

**දෙස් විදෙස් තොරතුරු එක් රැස් කර ජනතාවගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ඉටු කෙරෙන අතර ගුණාත්මක බවින් උසස් ග්‍රන්ථ පාඨකයන් අතට ලබාදීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ මණ්ඩලය ස්ථාපිත කරන ලදී**

**විශේෂ ස්තුතිය -**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති**
**ඩබ්. ඒ. අබේසිංහ**
**පාඨක සේවා අංශ ප්‍රධාන**
**ජසින්තා සෙනෙවිරත්න**
**පුස්තකාල සංවර්ධන අංශ ප්‍රධාන**
**ඩබ්. සුනිල්**
**ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශ ප්‍රධාන**
**ජානකී ප්‍රනාන්දු**

---

**සටහන -**
**චම්පිකා ශිරෝමාලා කස්තුරිආරච්චි**